# Abstract No 78

## බෞද්ධකර්මසිද්ධාන්තය හා භගවත්ගීතාවෙහි එන කර්මයෝගය පිළිබඳ සංසන්දනාත්මක අධ්‍යයනයක්.

**පූජ්‍ය මුවපැටිගේවෙල පඤ්ඤාලෝක හිමි**
කැලණිය විශ්වවිද්‍යාලයේ, බාහිර කථිකාචාර්ය, විද්‍යෝදය පිරිවෙණේ ආචාර්ය
ven.muwapetigewela@gmail.com

මුල් බුදුසමයාගත කේන්ද්‍රීය ඉගැන්වීම් අතර කර්මසිද්ධාන්තය ප්‍රමුඛ වූවකි. පුද්ගලයාගේ ක්‍රියාකාරී ගුණය වඩාත් ඇගයීමට ලක් වූයේ බුදුදහමෙහි ය. බෞද්ධකර්ම සිද්ධාන්තයෙහි සුවිශේෂ බව නම් සචේතනික වීමයි. ***(චෙතනා'හං භික්ඛවෙ කම්මං වදාමි, චෙතයිත්වා කම්මං කරොති, කායෙන වාචාය මනසා)*** පුද්ගලයාගේ ක්‍රියාකාරී බව කෙරෙහි කිසිදු බාහිර බලවේගයක බලපෑමක් නොපිළිගන්නා බුදුදහම අනීශ්වර හා අනියතිවාදී ව කර්මය විග්‍රහ කරයි. කර්මය සාංසාරික ව බද්ධ වූවක් බව ද කර්ම රැස්කිරීම මෙන් ම කර්මක්ෂය වීම ද අවධාරණය කරයි. කර්මයෙන් ඵලය ද ඵලයෙන් කර්මය ද ශූන්‍යබව දක්වා හේතුඵලවාදය මත පදනම් ව කර්මය විග්‍රහ කරයි. ගුරු-ලඝු වශයෙන් ප්‍රවර්ග කෙරෙන කර්ම ය බුදුදහම තුළ අවස්ථාන්තර අනුව ද, කාල අනුව ද, විපාක අනුව ද විවිධ නයින් ප්‍රභින්න ය. කර්ම නිදානය, විවිධත්වය, විපාකයාගේ නානත්වය, කර්ම නිරෝධය මෙන් ම ඒ සඳහා වන ප්‍රතිපදාව ද විවිධ තන්හි විස්තර වනු දක්නට ලැබේ. අනවරාග්‍ර වූ සංසාරයක සැරිසරණ පුද්ගලයන්ගේ කර්මස්කන්ධය අප්‍රමාණ්‍ය බැවින් බුදුදහම කර්මය අචින්ත්‍ය ධර්මයක් ලෙස ද දැක්වී ය. මහාභාරතයෙහි භීෂ්මපර්වයෙහි ඛණ්ඩයක් වන භගවත්ගීතාව ආචාරවිද්‍යාත්මක, යෝග ශාස්ත්‍රීය ජනප්‍රිය ග්‍රන්ථයකි. කර්ම හා ඥානයෝග ගැන ඉගැන්වෙන මෙහි ප්‍රමුඛතම සංකල්පය කර්මයෝගය බව ශ්‍රීමත් බාලගංගාධර තිලක් මහතා පවසයි. ගීතාවෙහි කර්මය පිළිබඳ ඉගැන්වීම් ප්‍රමුඛ ලක්ෂණ කිහිපයකි. කර්මය වනාහි බ්‍රහ්මොද්භූත ය, ***(කර්ම-බ්‍රහ්මොභවං).*** ආත්මය පදනම් කොට ගත්තකි. කර්ම ප්‍රතිබද්ධ පුද්ගලයා නිතර කර්ම කළ යුතු ය, ***(නියතං කුරු කර්මත්වං).*** අකර්මක වූවහුට ශරීරයාත්‍රාව ද සිදු කළ නොහැක්කකි. කර්ම අතර ද අසක්ත වූ කර්මය ම විශිෂ්ට කරණ ගීතාව ***(අසක්තඃ සවිශිෂ්‍යතෙ)*** ඵලාපේක්ෂාවෙන් කරණ කර්මය බැහැර කරයි. ආත්මය පදනම් කොටගත් භගවත්ගීතාවෙහි කර්මයෝගය බෞද්ධකර්මසිද්ධාන්තයට ප්‍රතිපක්ෂ වූවක් සේ පෙනුන ද ප්‍රතිජානනාත්මක ලක්ෂණ ද දක්නා ලැබේ. රාග, ද්වේශ, මෝහ ප්‍රහාණය උතුම් බව, නරක කර්ම කරන කිපුණු තැනැත්තා පාපියෙකු හා සතුරෙකු බව, ඉන්ද්‍රියයනට වඩා මනස උසස් බව ***(ඉන්ද්‍රියෙභ්‍යඃ පරංමනඃ),*** කර්ම විමෝක්ෂය ***(මුච්‍යන්තෙ තෙපිකර්මභිඃ)*** යනාදිය ඒ අතර ප්‍රමුඛ වේ. උක්ත කරුණු අනුසාරයෙන් බෞද්ධකර්ම සිද්ධාන්තය හා භගවත්ගීතාගත කර්ම යෝගය සංසන්දනයෙන් එකිනෙකෙහි විශේෂතා මෙන් ම සාමාන්‍ය ලක්ෂණ අධ්‍යයන කරනු ලැබේ.

**ප්‍රමුඛපදඃ**-බුදුදහම, භගවත්ගීතාව, කර්මය, වේදය, ආත්මය